ඒ සොඳුරු මතකය

අයියාගේ දෙවැනි දුවගේ විවාහයට අපේ ගමෙන් සෑහෙන පිරිසක් ඇවිත් තිබුණ. මන් ගම කියල කියන්නේ අපේ දෙමාපියන් අන්තිමට නැවතුන මතුගම නගරයට ළඟ ගුරුදොළ ගමට.

මගේ පියා උඩුනුවර, අම්මා බණ්ඩාරගම. ඒ තමා ඒ දෙගාල්ලන් ගම් පලාත් ලෙසට හඳුන්වන පලාත්. එක විදියකින් බැලුවොත් රයිගමයයි, ගම්පලයයි එකතු වුනා වගේ. මේ දෙන්න ගුරුදොළ පාසැලට මාරුවෙලා එහකොට මට වයස අවුරුදු පහක් විතර ඇති.

අම්මාගේ නෑදෑයෝ වන කටුගහහේනේ මුණසිංහලාට අයිති ඉඩමක තමයි පාසල හදල තිබුනේ. ඒ ළඟ අරමු කියල ඉඩමක් ඒ ඇත්තන්ගෙන්ම මගේ දෙමව්පියෝ මිල දීල අරගෙන තමයි ගෙයක් හදුවේ. ගුරුදොළ ඉඳල නෑබඩ පාර දක්වා එන්න තිබුණෙ ගුරු පාර. දැන් නම් ඒක තාර දාල නවීන කරලා. ඉඳහිට බස් එකතුත් යනව. ඒත් ඒ දවස්වල ඒ විදියට පහසුකම් තිබුණෙ නෑ. ඒ නිසා ගමන බිමන යන කොට මතුගමට යන්න බක්කි කරත්තය යොදාගන්න අපි කටයුතු කළා. ගමේ බක්කි කරත්ත කිහිපයක් තිබුණත් අපි යොදාගත්තේ අප්පුහාමිගේ බක්කි කරත්තය.

වසරෙ නුගක් වෙලාවට ලබා ගන්න පුළුවන්. අපි කොල්ලො රංචු ගැහිල මේ වතුරේ නානව. පරණ කලිසමක් ඇඳගෙන ඇලි වේලි පුරා දුවමින් දිය කෙළීම කොයි තරම් සුන්දරද? ගංවතුර වෙලාවට ඇළට මඟුරෝ, කනයෝ, පෙතියෝ එනව. ඒ වෙලාවට මාළු අල්ලන්නත් සූදානම් පිරිසක් ගමේ හිටිය. අපි කරන්නේ වටවෙලා මාළු අල්ලන හැටි බලා ඉන්න එක. දෙමාපියෝ අපිට කියල තිබුනෙ පව් වැඩවලට මොන විදිහකටවත් හවුල් වෙන්න එපා කියලයි. මාත් එක්ක හැම වෙලේම එකතු වුනේ මගේ අයියා. එයා මට වඩා වසරකින් පමණ තමා වැඩිමල්. ඒ නිසා අපි හැම වෙලේම යාළුවො මගේ තමයි හැසුරුනේ.

ගමේ ගෑනු ළමයි සමග අපිට සම්බන්ධකම්, මිත්‍රකම් තිබුණෙ නෑ. ඉඳහිට ඇල වේලිවල, නියර වල, නැත්නම් පාරෙදි හමුවෙලා හිනා වුනත් අප එකතු වෙලා කරපු දෙයක් මට මතක නෑ.

අයියගේ දුවගේ විවාහ මඟුලෙදි පරණ යාළුවො, නැත්නම් ඒ අයගෙ පුත්තු ගොඩක් හමුවුනා. ජේ.කේ. ගේ පවුලේ ලංගම වැඩකරන පුතෙක් දැන් ලොකු මිනිහෙක්. මාත් එක්ක ඉතාම කුළුපගව කථා කළා. අදිකාරම් පවුලේ පුතෙකුත් මා එක්ක සුහදව කථා කළා. ඒ අය දැන් ගමේ අලුත් නායකයෝ. ගමේම අය ඒ දවස්වල ජන්දය දුන්නේ දයා පසස්කුවෙල්ට. එහෙමත් කෙනෙක් තමා එක්සත් ජාතික පක්ෂයට හිටියේ.

අපේ ගමට උඩින් ගුරුදොළ වත්ත තිබුණ. ඒක රබර් වත්තක්. අපි එන දවස්වල ඒක අයිතිවෙලා තිබුණ පානදුරේ ඩයස් පවුලේ කෙනෙකුට. ගමත් එක්ක වැඩි ආශ්‍රයක් නොතිබුනත්, ගමේ නුග දෙනෙක් වත්තේ වැඩට ගියා. ඩයස් පවුලේ උදවිය තරමක් දුවල පැහැල යූ.ඇන්.පී. යට වැඩ කළා. ඒකෙන් වුනේ වම, දකුණ හැටියට වෙන්වීම තවත් ඉලිප්පිලා පෙනෙන එක විතරයි. ගමේ අලුත් පරම්පරාවේ උදවියත් ශ්‍රීලනිපයට තමයි හිතවත් වෙලා හිටියේ. ඒත් එදා කථා කරපු විදියට මට තේරුනේ, ඒ අය දැන් ඈත්වෙන්න පටන් අරන් කියලයි. ඩඩ...ඔබ තුමා ගැන වැරදි මත ඉදිරිපත් වෙන කොට අපිට ඉවසන්න බෑ. අපි කියල දෙනව ඔබ ගැන හොඳින් ඒ අයට..... කියල එක්කෙනෙක් කිව්වා. මට හිතුනේ මාව පුද්ගලිකව දන්නව කියන එක ගැන ඔහු සතුටු වෙන බවයි.

මතුගම ආනන්දයට ගිය දවස් වල මගේ පංතියේ හිටපු ගෑනු ළමයි දෙතුන් දෙනෙකුත් මට මුන ගැසුනා. ඒ අය අක්ක ළඟට ඇවිත් කියල තියෙනව මාව මුණගස්සල දෙන්න කියල. කෙලින් කියන්න ලැජ්ජ නිසා වෙන්න ඇති. ඒ දෙන්නම පස්සේ ගුරුවරියන් වෙලා දැන් විශ්‍රාමිකයින්. ඉන්ද්‍රානියි, කරවිටයි දෙන්න මන් මතකයට ගන්නෙ කල්පනා කරල. මට මතක් වුනා සුදු ගවුම් ඇඳගෙන හිටපු යාලුවො දෙන්න. කොච්චර කාලයකට පස්සෙ ද? ඉන්ද්‍රානි කිව්ව "අපි හැම වෙලේම ටෙලිවිෂන් එකේ දැක්කත් මතක් කරනව. ළමයින්ටත් කියනව අපි එක පංතියේ හිටියේ කියල..." එයා කිව්වේ සන්තෝසෙන්.

කිත්සිරි සර්, අමුවත්තේ ටීචර් සමග විජේසිංහ සර් ගැන මතක් කර කර අපි හිනාවුනා.

"...වික්‍රමබාහු එක්ක එක පංතියේ පහ දක්වා අපි ඉගෙන ගත්ත කියල අපි කියන්නේ සන්තෝසෙන් ..." කියල ඒ දෙන්න කිව්ව.

ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න

මට මතක හැටියට කරත්ත අප්පුහාමිත් මුණසිංහ කෙනෙක්. හැබැයි මුණසිංහලා ඔක්කොම නෑදෑයො නෙවෙයි. සමහරු වලව්කාරයෝ. අනික් අය එහෙම නෑ. අම්මා නම් කිව්වේ එළු මුණසිංහ, හොටෑ මුණසිංහ කියල වර්ග දෙකක් ඉන්නව කියල. අපේ අම්මා පරම්පරා ගැන විස්තර කියන්න හරි හපන-යක්. ඕන කෙනෙක් හමු වුනොත් විස්තර අහල මතක තියාගන්න එක එයාගේ පුරුද්දක්. හරියට කොම්පියුටරයකට දමල විශ්ලේෂණය කළා වගේ මේ තොරතුරු තුළින් පවුල්වල විස්තර වෙන් කරල හඳුනගන්න එක අම්මා හොඳට කළා. ඒවා කොච්චර ඇත්තද නැත්ද කියල මට කියන්න පුළුවන් කමක් නෑ. ඒත් ඇයට හොඳ රස කථා කියන්න පුළුවන්.

ගුරුදොළ ගම් පියසේ තියෙන කුඹුර විශාලයි. ඒකේ පැත්තක් නෑබඩ පාර දක්වා යනව. මේ මහ කුඹුර අයිතිවෙලා තිබුණෙ පල්ලියට. මට හරියට මතක නෑ මොන පල්ලියටද කියල. ඒත් එම මඩ වතුර අස්වද්දන්න බාර වෙලා තියෙන්නේ පල්ලියට කියලයි කව්රුත් කිව්වේ. පවුල් ගණනාවක්ම මේ කුඹුරේ වැඩ කරල අවුරුද්දට බත සොයා ගත්ත. අපේ ගේ හදපු අරඹට එහා වත්ත අයිති වුනේ ජෙරමානිස් කංකානමගේ කියන වාසගම තියෙන අයට. ඒ අයගේ මුත්තාට මල්පැන් වුට්ටා කියල අතියම් නමක් තිබුණ. ඒ කිතුල් ගස් මැදිමේ ලොකු සූරයෙක් හිසා. ගුරුදොළ හිටපු නුග දෙනෙකුගේ නමේ අගට සිංඤෝ කියන පදයත්, ගෑනුන්ට නෝනා කියන පදයත් තිබුණ. ඒ අනුව ඩේලින් සිංඤෝ, ඇඩ්වින් සිංඤෝ ආදී ලෙසටත්, ජේන් නෝනා, කුසුම් නෝනා ආදී වශයෙන් නම් වලින් අහල පහල උදවිය පෙනී සිටියා. ඒ කෑලි දෙක බද්ධ නූන නම් ඇත්තටම තිබුණෙ ඉතාම ටිකයි. ඒ කුල වශයෙන් පහලයි කියල සළකපු අයට. කුල භේදයක් ලොකුවට තිබුනෙ නැති වුනත්, අවාහ විවාහ වලදි එයට ඉඩක් තිබුණ බව මට මතකයි.

අපි එන දවස්වලත් ගුරුදොළ හන්දියේ කඩයක් දෙකක් තිබුණ. සැමපි සිංඥෝ මුදලාලි කඩේ අයිතිකාරය. එතැන සුළු කෑම බීම සමග තේ වතුරත් තිබුණ. මන් පස්වෙනි පංතිය දක්වා ගියේ මතුගම ආනන්දයට. ඒ දවස්වලත් ඒක ටිකක් ලොකු පාසලක්. හතර වටෙන්ම ළමයි මතුගම ඒ පාසැලට ආව. අපි මුළින් ගියේ බක්කි කරත්තෙන්. පස්සේ සමහර වෙලාවට ඇවිදගෙනත් ගියා. අම්මගේ ඔලුවෙ තිබුනෙම අපව ගමෙන් ඉවත් කරල කොළඹ හරි පානදුරේ හරි ඉගෙනීමට අරින්න. දෙමාපියෝ හුගක් මහන්සිවෙලා අපිව කොළඹටත්, පානදුරයටත් පංගාර්තු කළා. ඒ නිසා මට ගම තුළ තිබුණ සම්බන්ධකම් නැති වුණා. මන් ගැමියෙක් වුනේ පාසැල් නිවාඩුවට ගෙදර ආවම විතරයි.

අපේ ගේ ඉදිරියේ වත්ත අද්දරින් පාර ගියා හැළඹේට. හැළඹේ ඉඳල දැන් අගලවත්තට කෙළින් යන්න පුළුවන්. ඒ අනුව හරස් පාරකින් නෑබඩ පාරත්, අගලවත්ත පාරත් එකතු වුනා. පාරට ඉස්සරහින් තියෙන්නේ කුඹුර. මේ මහ කුඹුර මැද ඇළ. ඒ දවස්වල ඉතාම ලස්සනයි. පිරිසිදු වතුර

Tomorrows Migration Solutions Today...

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

LAW INSTITUTE OF VICTORIA SPECIALIST ACCREDITATION

Our team of Specialist Lawyers, Lawyers & Barristers in Melbourne competently assisted many Sri Lankans, many other nationalities and many Australian Companies in the following areas of Migration matters over the years and continue to do so:

- General Skill Migration Permanent Resident visas
- General Skill Migration Provisional Resident visas
- Second stage Skilled Regional (Permanent residence) visas
- Graduate Skill Temporary visas
- Complex Student visas
- 457 Visas
- Employer Nominations (ENS)
- Employer Contracts
- Negotiations of employer nominations with the Australian Employers
- Regional Sponsored Migration Scheme (RSMS)
- Skill Assessments
- State Sponsorships
- TRA cancellations
- Criminal Prosecutions on TRA cancellations
- Student Visa Cancellations
- Permanent residence Cancelations
- Appeals to the Migration Review Tribunal (MRT) or Administrative Tribunal (AAT)
- Business Migration State Sponsorships
- First and Second Stage Business Migration visas
- Spouse & visas
- Aged Parent visas
- Aged Dependent Parent visas
- Contributory Parent visas
- Resident Return visas
- Australian Citizenships

Our Team of Lawyers:

Don Susantha Katugampala LL B (Monash)
MARN: 9601070
Accredited Immigration Law Specialist
Principal Lawyer – Fairfields Lawyers

Michael Gros LL B (Monash)
MARN: 9803398
Consulting Barrister

Frank Sabelberg LL B (Monash)
MARN: 0004726
Consulting Solicitor

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

10 Morrison Place East Melbourne VIC 3002
T | 03 9650 4557 F | 03 9650 4559
info@fairfieldslawyers@com.au

We Deliver Results...